WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

## නාට්‍ය හා රංග කලාව (සිංහල) II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) කාලගෝල කතා පුවත ඇතුළත් වන ජාතක කතාව කුමක් ද? (ලකුණු 02 යි)

(ii) දික්තල කාලගෝල නාට්‍යයේ පසුබිම් සංගීතය සඳහා භාවිත කරන සංගීත භාණ්ඩ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) පොතේගුරු විසින් නාට්‍යය ආරම්භයේ දී හා අවසානයේ දී ඉදිරිපත් කරනු ලබන ගායන අංග **දෙක** කුමක් ද? (ලකුණු 02 යි)

(iv) මෙම නාට්‍යයේ සංවාදවල සඳහන් වන ජාතක කතාව සහ රජ්ජුරුවන් **ගේ** නම කුමක් ද? (ලකුණු 02 යි)

(v) මහෞෂධ පඬිතුමා පවසන ආකාරයට නීති මාර්ගයෙන් ලබාගත **නොහැක්කේ** කුමක් ද? (ලකුණු 02 යි)

(vi) දික්පිටියා ගේ චරිතයෙන් ප්‍රකට වන අයහපත් ගතිලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

**2.** (i) 'රංග ක්‍රීඩා' යනු කුමක් දැ යි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) රංග ක්‍රීඩා **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (ii) හි සඳහන් රංග ක්‍රීඩා මගින් ආධුනික රූපණ ශිල්පීන්ට ලැබෙන ප්‍රයෝජන මොනවා දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) 'අංග රචනය' යනු කුමක් දැ යි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) අංග රචනය සඳහා භාවිත කරන ද්‍රව්‍ය සහ උපකරණ **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) වේදිකා නාට්‍යවල චරිත නිරූපණය සඳහා අංග රචනය අවශ්‍ය වන්නේ කවර හෙයින් ද යන්න කරුණු **තුනක්** යටතේ නිදසුන් සහිත ව පෙන්වාදෙන්න. (ලකුණු 06 යි)

WWW.OLEVELAPI.COM

**4.** (i) පහත රට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි නම් කළ ශාන්තිකර්මවල අන්තර්ගත නාට්‍යමය පෙළපාළි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (ii) හි සඳහන් කළ නාට්‍යමය පෙළපාළියක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ මොනවා දැ යි විමසාබලන්න. (ලකුණු 06 යි)

**5.** (i) කෝලම් රංග භූමියක රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) කෝලම් උපත් කතාව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) සාම්ප්‍රදායික කෝලම් රැඟුමක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා දැ යි පෙන්වාදෙන්න. (ලකුණු 06 යි)

[ හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

6. (i) ආර්.ආර්. සමරකෝන් විසින් රචනා කොට අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඔබ නම් කළ නාට්‍ය නිර්මාණවල දිස් වන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට ආර්.ආර්. සමරකෝන් **ගෙන්** සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. පැය කිහිපයක් තුළ සිදුවන සිද්ධීන් එක ස්ථානයකට සීමා වන සේ නාට්‍ය වස්තුව සකස් කළ යුතු ය.

කමල් සාමාන්‍ය පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත්වීම නිසා මව කමල්ට ස්මාර්ට් ජංගම දුරකථනයක් තෑගි කරයි. මෙය දකින කමල්ගේ නංගි තමාට ද ජංගම දුරකථනයක් අවශ්‍ය බව පවසයි. දරුවන්ට ජංගම දුරකථන ලබාදීම පිළිබඳ ව පියා තදින් ම විරුද්ධ වෙයි. පැරණි අදහස් ගරු කරන සීයා මෙම ප්‍රශ්නයට මැදිහත් වෙයි.

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

***

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...